**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 24 දින ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධින ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන් හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිළධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට රු. 554,855,000 ක අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | අග්‍රිම ලැබීම නියමිත පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීමේ අවශ්‍යතාවය | පෙර වර්ෂවලදී ඉදිරිපත් කර ඇති ආකාරයටම 2019 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත්කර ඇති අතර විගණනයෙන් පෙන්වා දීඇති පරිදි ඉදිරිවර්ෂ වලදී අග්‍රිම ලැබීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා එවා තිබුණි. |
| (ආ)වර්ෂය තුළ ලද ආදායම් නොවන ලැබීම් හා අනෙකුත් ආයතන වෙනුවෙන් රැස් කරන ලද ආදායම පිළිවෙලින් රු. 121,435,816 ක් හා රු. 22,514,574 ක් වුවද එම වටිනාකම් හඳුනාගත හැකි පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මුදල් ලැබීම් හා ගෙවීම් අනුව සකස් කර ඇති බවත් ඉදිරි වර්ෂවලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය වෙනත් ආයතන වෙනුවෙන් රැස්කරන ලද ආදායම් ලෙස වටිනාකම් දැක්වීමට හැකි අයුරින් ලැබීම් වෙන් වෙන්ව පෙන්වීමට කටයුතු කරන බව දන්වා එවා තිබුණි. |
| (ඇ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහ සහනාධාර මාරු කිරීම්වල එකතුව රු. 413,676,396 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු. 433,041,912 ක් ලෙස දක්වා | මුදල් ගලායාම් නිසි පරිදි සටහන් කිරීමේ අවශ්‍යතාවය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල හරස් සටහන් මගින් සිදුවූ ලැබීම් ගෙවීම් නොමැතිවීම නිසා විගණනය විසින් පෙන්වා ඇති වෙනස්කම් සිදුවී ඇති බවත්, පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් |

| | | |
|---|---|---|
| තිබීම හේතුවෙන් මුදල් ගලායාම රු. 19,451,592 කින් වැඩිපුර දක්වා තිබුණි. | | වියදම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පෙන්වා ඇති අගය තුළ සේවක ණය අත්තිකාරම් ගෙවීම්ද ඇතුලත්ව ඇති බවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් යටතේ එම ගෙවීම් ඇතුලත් කර නොමැති හෙයින් මුදල් පොතේ මුදලින් කළ ආදායම් වියදම් මත මුදල් ප්‍රවාහ සකස් කර ඇති අතර වැඩිපුර මුදල් ගලායෑම් පෙන්වා නොමැති නමුත් එකිනෙක ශීර්ෂ යටතේ දැක්විය යුතු අගයන් වෙනස්වී ඇති බවත් දන්වා එවා තිබුණි. |
| (ඇ) තැන්පතු ලැබීම් රු. 54,325,515 ක් හා තැන්පත් ගෙවීම් රු. 93,467,643 ක් දෙපාර්තමේන්තු ගිණුම් තුල දක්වා තිබුණද එම අගයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි. | තැන්පතු ලැබීම් හා ගෙවීම් නිවැරදිව මුදල් ප්‍රවාහයට ගැලපීමේ අවශ්‍යතාවය | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් එක් එක් ශීර්ෂය යටතේ පැහැදිළිව ලැබීම් ගෙවීම් හඳුනාගෙන වර්ග කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිවර්ෂ වලදී පිළියෙළ කිරීමට කටයුතු කරන බව දන්වා එවා තිබුණි. |
| (ඉ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 271/2019 හා 2019 දෙසැම්බර් 03 දිනැති චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ගණනය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම් වටිනාකමින් තැන්පත් ගිණුම් වටිනාකම අඩු කල යුතු අතර එලෙස අත්තිකාරම් ශේෂයෙන් තැන්පතු ශේෂය අඩු කල පසු ලැබෙන අගය රු. 80,887,471 ක් වුව ද එය රු. 79,125,679 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ශුද්ධ වත්කම් ගණනය කිරීමේ අවශ්‍යතාවය | අත්තිකාරම් ගිණුමේ වටිනාකමින් තැන්පත් අඩුකළ පසු ශුද්ධ වත්කම් අගය ලැබෙන නමුත් 2019 වර්ෂයේ මැතිවරණ දීමනා ගෙවීම් කළද මැතිවරණ කාර්යාලයෙන් අප වෙත ගෙවීම් නොකළ බැවින් ශුද්ධ වත්කම් වල අගය එම වගකීම් වල ප්‍රමාණයෙන් අඩුවිය යුතු බව දන්වා එවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) නොපිය වූ අග්‍රිම ශේෂය වූ රු. 1,761,792 ක් මූල්‍ය වත්කමක් ලෙස ද දැක්විය යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි එලෙස දක්වා නොතිබුණි. | පියවා නොමැති අග්‍රිම ශේෂය මූල්‍ය වත්කමක් ලෙස දැක්වීමේ අවශ්‍යතාවය | නොපිය වූ අග්‍රිම ශේෂය මූල්‍ය වත්කමක් වුවද මෙම ආයතනය තුල නොපිය වූ අග්‍රිම ලෙස දක්වා ඇත්තේ මැතිවරණ කාර්යාලය විසින් මෙම ආයතනයට පියවියයුතු අත්තිකාරමක් වන බැවින් එම මුදල මෙම ආයතනයේ පැත්තෙන් වගකීමක් වන අතර වත්කමක් නොවන බව දන්වා එවා තිබුණි. |
| (උ) අත්තිකාරම් ලැබීම් රු. 21,767,894 ක් හා අත්තිකාරම් ගෙවීම් රු. 26,563,420 ක් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයෙහි ඇතුළත් කර නොතිබුණි. | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සටහන් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | පැහැදිලිව හඳුනාගෙන ඉදිරි වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරි වර්ෂවලදී පිළියෙල කරන බව දන්වා එවා තිබුණි. |

## 1.6.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවිය යුතු ශේෂය රු. 93,119,762 ක් වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව අයවිය යුතු ශේෂය රු. 93,050,364 ක් විය. ඒ අනුව රු. 71,024 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස තුළ රු. 1,626 ක ශේෂයක් හඳුනානොගත් අතිරික්තයක් ලෙස දක්වා තිබුණි. මෙම වෙනස්කම් ඉකුත් වර්ෂයේ සිට පැවත එන අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ශේෂ අතර පවත්නා වෙනස්කම් අප්‍රමාදව සැසඳීම් කර නිරවුල් කරගැනීමේ අවශ්‍යතාවය | 2015 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකුගේ රු.71,024 ක ණය ශේෂය 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමට හර කර ඇති නමුත් ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ යටතේ දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත් වල සටහන් නොවී තිබීම නිසා මෙම වෙනස ඇති වී ඇති බවත්, එම වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා එවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව නිලධාරියෙක් මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂය නොපෙන්වීමට වගබලා ගත වුවද වර්ෂ 20 සිට වර්ෂ 33 දක්වා කාලයක් ගත වූ ණය ශේෂ 03 ක වටිනාකම වූ රු. 11,916 ක් ගිණුමේ පෙන්වා තිබුණි. | නිරවුල් නොවී පවත්නා ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | මුදල් අමාත්‍යාංශයේ දැනුම්දීම අනුව 2020 ජූනි 22 දින මැතිවරණ කොමිෂන් සභාව වෙතින් මෙම නිලධාරීන්ගේ තොරතුරු ඉල්ලුම් කර ඇති බව දන්වා එවා තිබුණි. |
| (ඇ) | විශ්‍රාම ගොස් මාස තුනක හා වසර තුනක කාලයක සිට නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 510,202 ක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | -එම- | එක් නිලධාරියෙකුගේ ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යන බවත් අනෙක් නිලධාරියාගේ ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකය සකස් කිරීමෙන් පසු අයකර ගැනීම කල හැකි බවත් දන්වා එවා තිබුණි. |
| (ඈ) | වැඩ තහනම් කල හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 සිට වර්ෂ 08 දක්වා කාල පරාසයකට අයත් එකතුව රු. 308,614 ක හිඟ ණය ශේෂයන් 03 ක් අයකර ගැනිමකින් තොරව පැවතුණි. | -එම- | මෙම හිඟ ණය ශේෂය අයකර ගැනීමට සඳහා නෛතික කටයුතු ආරම්භ කර ඇති බව දන්වා එවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, හිඟහිටි ආදායම් රැස්කිරීම, අදායම් අත්හැරීම් හා කපා හැරීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට රු. 512,531,243 ක් වූ හිඟ ආදායමින් රු. 293,770,892 ක් හෙවත් සියයට 57 ක් වර්ෂ 01 සිට වර්ෂ 11 ක් දක්වා වූ කාල පරාසයකට අයත්ව පවතින බව නිරීක්ෂණය විය. | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය | සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම හා තක්සේරු ගාස්තු ආදායම දෙපාර්තමේන්තු ගිණුමේ සංඛ්‍යා අනුව නිවැරදි බවත්, හිඟ ආදායම් රු. 218,760,351 තුල රු. මිලියන 167.5 ක් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ වත්කම් තක්සේරු වෙනුවෙන් ලැබිය යුතු ආදායම් බවත්, ඒ අනුව අනෙකුත් ආයතන වලින් ලැබිය යුතු මුළු හිඟ ආදායම රු.මිලියන 51.2 ක් බව දන්වා එවා තිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුලදී පසුගිය වර්ෂය අවසානයට පැවති රු. 317,424,002 ක හිඟ ආදායමෙන් රු. 23,653,110 ක් හෙවත් සියයට 07 ක් පමණක් අයකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | සමාලෝචිත වර්ෂය තුලදී පසුගිය වර්ෂය අවසානයට (2018.12.31 දිනට) පැවති රු.293,770,892.13 කින් රු. 23,653,110 ක් හෙවත් සියයට 8 ක් පමණක් අය කරගෙන ඇති බවත් අනෙකුත් සංඛ්‍යා නිවැරදි බවත් දන්වා එවා තිබුණි. |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්තාව අනුව රජයේ ආයතන 03 කින් රු. 223,158,901 ක විශාල ආදායමක් දිගුකාලීනව හිඟව පවතින බව නිරීක්ෂණය විය. | -එම- | හිඟ ලේඛනයේ පවතින ආයතන, ලිපි මගින් දැනුවත් කිරීම ,මෙම ආයතන සමග රැස්වීම් හා සාකච්චා කිරීම,එම ආයතන විසින් එම හිඟ සනාථකර ගැනීම සඳහා නැවත විමසන කරුනු කඩිනම් කර යැවීම වැනික්‍රියාමාර්ග වර්ෂය පුරා අනුගමනය කිරීමෙන් මෙම මුදල් අය කර ගැනීමට හැකි බව දන්වා එවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) මහ කොළඹ පලාත් තක්සේරු කාර්යාලයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පවතින ආදායම රු. 295,490,576 ක් බව නිරීක්ෂණය විය. මෙම හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට පවතින මුළු හිඟ ආදායමෙන් සියයට 58 ක් බව නිරීක්ෂණය විය. | -එම- | මහ කොළඹ පළාත් තක්සේරු කාර්යාලයේ සමාලෝචිත වර්ෂය අවසානයට හිගව පවතින ආදායම වන රු. 295,490,576 ක මුදල දෙපාර්තමේන්තු ගිණුම් අනුව නිවැරදි බව දන්වා එවා තිබුණි. |
| (ඉ) දක්වා ඇති නිරීක්ෂණ අනුව රජයට ලැබිය යුතු ආදායම් අයකර ගැනීමටත්, තවදුරටත් සේවා සැපයීමේදී හිඟ ආදායම අයකර ගැනීමට ප්‍රමුඛතාවය දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවිය යුතු බව විගණනයේදී අවධාරණය කෙරේ. | -එම- | (ඉ). මෙම හිග ආදායම් අයකර ගැනීමට දැනට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා එවා තිබුණි.<br>* අදාල ආයතන දැනුවත් කිරීම හා හිඟ මුදල් අය කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම.<br>* එම ආයතන වලට හිග මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යැවීම,ලිපි යැවීමෙන් පසු එම ආයතන නැවත විමසන කරුණු සනාථ කර යැවීම.<br>* නාගරික සංවර්ධන අධිකාරියෙන් මුදල් අයකර ගැනීම සඳහා භාණ්ඩාගාර නියෝජිත දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br>* මෙම දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල දැනුවත් කිරීම.<br>* මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් හා විගණන කළමනාකරණ කමිටුවලදී සාකච්ඡා කර ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම. |

## 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූලධන වැය විෂයයන් 2 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු. 3,400,000 ක් වූ අතර ප්‍රතිපාදන ඉතිරිය රු. 2,792,858 ක් විය. එක් එක් වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිකිරීම් සියයට 80 සිට සියයට 84 දක්වා විහිදී පැවතුණි. | සලසාගත් වාර්ෂික අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂමව උපරිම වශයෙන් උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය | අදහස් දක්වා නොතිබුණි. |

## 2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් රු. 687,887 ක් වූ අතර එයින් රු. 662,316 ක් මාසයකට වැඩි කාලයක් පුරා හඳුනානොගත් ලැබීම් වන අතර රු. 238,583 ක් වර්ෂයක් ඉක්මවා ඇතත් ආදායම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනානොගත් ලැබීම් අප්‍රමාදව හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය | මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වා එවා තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 වත්කම් කළමනාකරණය

----------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | | මධ්‍යම පළාත් කාර්යාල ඉඩම හා ගොඩනැගිල්ල | | |
| | i. | තක්සේරු දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් කාර්යාලය හා සංචාරක නිවස පිහිටා ඇති ඉඩම වසර 25 කට වඩා පෙර කාලයකදී දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් 2019 ජූලි දක්වා මෙම ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි. | දේපලවල අයිතිය විධිමත් පරිදි අප්‍රමාදව පවරාගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | තක්සේරු දෙපාර්තමේන්තුවේ සංචාරක නිවාස සහ පළාත් කාර්යාලය පිහිටි ඉඩම නොමිලේ ලැබුණු දේපළක් නොවන බවත් තක්සේරු දෙපාර්තමේන්තුව එහි අයිතිය තහවුරු කරගැනීම සඳහා විශාල වෙහෙසක් දරමින් කටයුතු කරමින් පවතින බවත් දන්වා එවා තිබුණි. |
| | ii. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරන ලද අවස්ථාවේදී ඇති වූ තිබුණු නීතිමය ගැටළුවක් හේතුවෙන් එහි සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර, ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුවට භාර දුන් 2009 ඔක්තෝබර් 27 දින සිට මේ දක්වා ක්‍රියාත්මක නොකර නිශ්ක්‍රියව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිශ්ක්‍රිය වත්කම් අප්‍රමාදව පරිහරණයට ගැනීමේ අවශ්‍යතාවය | මෙම ගොඩනැගිල්ල එවකට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සමඟ ඇති වී තිබෙන නීතිමය ගැටළුවක් හේතුවෙන් වායු සමීකරණ යන්ත්‍ර භාරදීමක් සිදුකර නැති බවත් දන්වා එවා තිබුණි. |
| (ආ) | i. | මහනුවර නගරයට ඉතා ආසන්නයේ ඇති මෙම රජයේ ගොඩනැගිල්ලේ පවතින ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට ගැනීම සඳහා වඩාත් ඵලදායී වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කර නොතිබූ බවත් මෙය ප්‍රයෝජනයට ගැනීම ඉතා කලාතුරකින් සිදුවන බවත් නිරීක්ෂණය විය. තවද, | -එම- | ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට ගැනීම සඳහා තවත් විශාල කාර්යභාරයක් ඉටුකරගත යුතුව ඇති බවත්, ඒ සඳහා වැඩපිළිවෙළක් දැනටමත් සකස් කර අළුතින් වායුසමීකරණ පද්ධතියක් සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතින බවත්, ඉදිරියේදී වඩාත් ඵලදායී ලෙස මෙම ශ්‍රවණාගාරය යොදා ගැනීමට බලාපොරොත්තු වන බවත් දන්වා එවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මෙම පරිශ්‍රය වෙනත් දෙපාර්තමේන්තු වල පුහුණු කාර්යයන් සඳහාද යොදවා ගැනීමේ අරමුණු ඇතිව සිදුකර ඇතත් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| ii. | මෙම ශ්‍රවණාගාරය වෙනත් රජයේ කාර්යයන් සඳහා කුලී පදනමට හෝ යොදවා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි. | -එම- | මෙම ශ්‍රවණාගාරය වෙනත් කාර්යයන් සඳහා කුලී පදනම මත යොදවාගැනීමට කුලී තක්සේරුකර සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් පවතින බවත් දන්වා එවා තිබුණි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | ---------------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යයන් ඉටුනොකළ ලිපිගොනු 1278 ක් ඉතිරි වී තිබුණි. | සැලසුම් කල පරිදි කාර්යයන් ඉටු කිරීමේ අවශ්‍යතාවය | දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරි හිඟය හා අතිවිශේෂ හා ප්‍රමුඛතා දියයුතු සංවර්ධන ව්‍යාපෘතිවලට අවධානය යොමු කිරීම හා ආරක්ෂිත හේතූන් මත ගොඩනැඟිලිවලට ප්‍රවේශ වීමට ඉඩ නොදීම හා අදාල දේපලවල පවතින අඩුපාඩු හේතුවෙන් වාර්ෂිකව පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීමට නොහැකිව ඇති බව දන්වා එවා තිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත අනුමත සේවක සංඛ්‍යාවෙන් 255 ක් හෙවත් සියයට 31 ක් පුරප්පාඩුවී පැවතුණි. | මේ අයුරින් කාර්යමණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපා ඇති හෙයින් කඩිනමින් එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | එකඟ වන බව දන්වා එවා තිබුණි. |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 185 ක් හෙවත් සියයට 81 ක් ද තෘතියීය මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 49 ක් හෙවත් සියයට 13 ක් ද ද්විතිය මට්ටමේ 14 ක් හෙවත් සියයට 11 ක් ද පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වේ. | -එම- | ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක ප්‍රධාන තක්සේරුකරුවන් 03 ක් සඳහා සුදුසුකම් සම්පූර්ණ නිලධාරීන් නොමැති බවත්, නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවන් 15 කින් පුරප්පාඩු 10 ක් පිරවීමට සම්මුඛ පරීක්ෂණ සිදුකර ඇති බවත්, ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් 60 සඳහා සුදුසුකම් සම්පූර්ණ නිලධාරීන් නොමැති බවත් ගණකාධිකාරි තනතුර සඳහා ලිපි මඟින් ඉල්ලුම් කර ඇති බවත් දන්වා එවා තිබුණි.<br><br>තෘතීය මට්ටමේ සහකාර තක්සේරුකරුවන් 46 ක් සඳහා හා අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති 200 න් 100 ක් ඇතුළු තනතුරු 153 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සූදානම් කර ඇති බවත්, දන්වා එවා තිබුණි. භාෂා පරිවර්තක තනතුරක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තනතුරු 02 ක් සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් |

| | | | |
|---|---|---|---|
| | | | කර ඇති බවත් දන්වා එවා තිබුණි.<br><br>ද්විතියික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලුම් කර ඇති බවත් අනුමත තනතුරු 139 න් 132 සම්පූර්ණ කර ඇති බවත්, දන්වා එවා තිබුණි. |
| (ඇ) | අංක 2142/75 හා 2019 සැප්තැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රසිද්ධ කර එදින සිට ක්‍රියාත්මක වීම බලගන්වා වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් ඒ අනුව අවශ්‍ය තක්සේරු නිලධාරීන් බඳවාගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | -එම- | නව ශ්‍රී ලංකා තක්සේරු ව්‍යවස්ථා සංග්‍රහය අනුව සේවයේ යෙදී සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීමට කටයුතු අවසන් කර ඇති බවත් 11/11 සහකාර තක්සේරුකරු තනතුරු 153 ක් හා 1/11 තක්සේරුකරු තනතුරු 105 ක් සම්පූර්ණ කිරීමට කටයුතු සූදානම් කර ඇති බවත් දන්වා එවා තිබුණි. |